# වලියක් මංගල්‍යය හෙවත් වලියකුම ශාන්තිකර්මයේ ආගමික මුහුණුවර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.ඒ. ශෂී සඳලංකා ධර්මරත්න[1]

## හැඳින්වීම

දළදා පෙරහැර මංගල්‍යයේ අවසාන අංගය වශයෙන් පවත්වනු ලබන වලියකුම හෙවත් වලියක් ශාන්තිකර්මය පෙරහැරට දායක වූ පිරිසගේ වස් දොස් මකා දැමීම පිණිස පවත්වනු ලබන ශාන්තිකර්මයකි. අවුරුද්දකට එක් වරක් පමණක් පවත්වනු ලබන මෙම ශාන්තිකර්මය බහුවිධ ආගම් හා සම්මිශ්‍රණය වී ඇති බවක් පෙනේ. මෙම වලියක් මංගල්‍යය තුළින් නිශ්චිතවම හඳුනාගත හැකි ආගමික සම්ප්‍රේෂණයන් මොනවාද යන ගැටලුව පදනම් කරගනිමින් මෙම පර්යේෂණය ගොඩනැගී ඇත. වලියක් මංගල්‍යයෙහි පවතින විවිධ ආගමික සම්ප්‍රේෂණයන් මොනවාද යන්න හඳුනා ගැනීමත් මෙහි ආරම්භය හා විකාශය පිළිබඳවත් සංස්කෘතිකාංගයක් හා දේශීය උරුමයක් වශයෙන් මෙහි පවතින වැදගත් බව විමර්ශනයට ලක් කිරීම මෙහි ප්‍රධාන අරමුණු වශයෙන් පෙන්වා දිය හැකි ය. වලියකුම මංගල්‍යයේ අරමුණු, ඒ වටා බැඳී පවත්නා සිරිත් විරිත් සම්ප්‍රදායන්, මෙම සංස්කෘතියේ ආරම්භය හා විකාශය එහි දක්නට ලැබෙන ආගමික සම්ප්‍රේෂණයන් පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් මෙම පර්යේෂණය තුළ අවධාරණය කෙරේ. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් සිදු කරනු ලබන අතර ඒ සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස විෂය පිළිබඳ විද්වතුන් සමග පවත්වනු ලබන සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් තොරතුරු ලබා ගැනීම සිදු කරයි. ඊට අමතර ව එවන් අවස්ථා නිරීක්ෂණයෙන් ලබාගත් තොරතුරුද ඒ හා සමගාමීවම ඉදිරිපත් කරනු ලැබේ. ද්විතියික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳ ව සාකච්ඡා වන ග්‍රන්ථ, පර්යේෂණ ලිපි හා සඟරාද පරීක්ෂා කරනු ලබන අතර එයින් ද තොරතුරු උකහා ගැනේ. වලියකුම ශාන්තිකර්මයෙහි විවිධ අංගයන් තුළ ඇති වටිනාකම් අවධාරණය කිරීමත් මෙහි දී දැකගත හැකි විවිධ ආගමික සම්ප්‍රේෂණයන් තුළ ගැබ් වී ඇති හරය ඉස්මතු කිරීමත් මෙහි වැදගත්කම වශයෙන් පෙන්වා දිය හැකි ය.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයෙන් සිදු කරනු ලැබේ. මෙහි දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් මෙම විෂයපථය පිළිබඳ ගැඹුරින් දත් විද්වත් පිරිසක් තෝරාගෙන කරනු ලබන සම්මුඛ සාකච්ඡාවන්ගෙන් මෙම ශාන්තිකර්මය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සිදුකරනු ලැබේ. ඊට අමතර ව වාර්ෂිකව ඒ හා කටයුතු කරන ආලත්තිය අම්මාවරුන්ගෙන් ද තොරතුරු ලබාගෙන මෙහි සටහන් කර ඇත. තවදුරටත් ජ්‍යොෂ්ඨ මහාචාර්ය මුදියන්සෙ මහතා විසින් රචනා කරන ලද ග්‍රන්ථය හා අනෙකුත්

1. පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

ද්විතියික මූලාශ්‍රයන්ගෙන්ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගන්නා අතර ලබාගත් තොරතුරු විමර්ශනාත්මකව පර්යේෂණ පත්‍රිකාවෙහි සටහන් කරනු ලැබේ.

**සාකච්ඡාව**

මෙම පර්යේෂණයෙහි තේමා විෂයපථය පිළිබඳ අවධානය යොමු කරන විට පෙනී යන්නේ මෙම ශාන්තිකර්මය දළදා පෙරහැර හා සමගාමී සංස්කෘතිකාංගයක් බව යි. කෙසේ වෙතත් දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර නිමා වී ගෙට ගෙවදින අවස්ථාවෙහි මහනුවර විෂ්ණු දේවාලයෙහි මෙම ශාන්තිකර්මය කිරීම ආරම්භ වේ. මෙකී සංස්කෘතිකාංගයෙහි ආගමික මුහුණුවර පිළිබඳ කරුණු විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ මෙය විශේෂයෙන් බෞද්ධ මුහුණුවර හා හින්දු ආගමික ඇතැම් ලක්ෂණද මෙහි දැකිය හැකි වන බව යි. උක්තව සඳහන් කරන ලද ආගමික සම්ප්‍රේෂණයන් සංකේතාත්මකව පිළිබිඹු කරන අවස්ථාවන් කිහිපයක්ම ඇති බව මුදියන්සේ මහත්මා විසින් අවධාරණය කරනු ලැබ ඇත. එම සංකේතාත්මක ප්‍රතිනිර්මාණයන් වශයෙන් සොළාස්මගල, ගවර මල වැනි දේ පෙන්වා දිය හැකි ය. දේශයේ ආඪ්‍යයත්වය මෙන් ම පෙරහැරට විවිධ ආකාරයෙන් දායක වූ සියලු දෙනාගේ වස් දොස් ආදිය විනාශ කිරීම යන අපේක්ෂාවන් මූලික කර ගනිමින් එම නිර්මාණයන් සිදු කරනු ලබන බව පිළිගැනීමයි. එමඟින් අනාවරණය වන සාධකය වන්නේ හින්දූන් විසින් කරනු ලබන කෝලම් චිත්‍ර සංකල්පය මින් නිරූපිත බව යි. මෙම ශාන්තිකර්මය සඳහා පේවීම ද එහි දී සිදුකරනු ලබන විශේෂ වතාවතකි. ඒ සඳහා විශේෂයෙන් මස් මාංශ අහාරයට නොග ැනීම, ස්ත්‍රී පුරුෂ සේවනයෙන් තොර වීම, දෙවියන් සඳහා කිළි නොවන ආකාරයෙන් සුදුසු සියලු වතාවත් සම්පූර්ණ කිරීම යන වතාවත් වලින් පේවීම තුළින් ඔවුන් ආශිර්වාද බලාපොරොත්තු වේ. බෞද්ධ විශ්වාසයක් හා පුහුණුවක් වශයෙන් මස් මාංශ ආහාරයට නොගැනීමත් හින්දු විශ්වාසයක් ලෙස ස්ත්‍රී පුරුෂ සේවනය නොකිරීමත් යන මෙම විශ්වාසයන් එහි අන්තර්ගත වී තිබීමෙන් පෙනී යන්නේ මෙහි හින්දු සහ බෞද්ධ යන සම්ප්‍රේෂණයන් දක්නට ලැබෙන බව යි. තවදුරටත් මෙකී කාරණාවන් විමර්ශනය කරන කල්හි මෙම නර්තනය ආරම්භ කිරීමට මත්තෙන් "පරහඳ ගෑම" චාරිත්‍රයක් වශයෙන් සිදු කරයි. ඉන් ඔවුන් බලාපොරොත්තු වන්නේ දේවාශීර්වාදය ලබාගැනීමයි. චාරිත්‍රයක් වශයෙන් හින්දූන් අතර ජනප්‍රිය මෙම චාරිත්‍රය මෙම සංස්කෘතිකාංගයට සම්ප්‍රේෂණය වූවේ හින්දූන් අතරින් බව මින් ගම්‍යමාන වේ. එමෙන් ම උඩරට නර්තන ශිල්පීන්ගේ ජටාවැලෙහි පඬුරු ගැටගැසීමද මෙහි විශේෂිත සංස්කෘතික හර පද්ධතියක් වශයෙන් ගත හැකි ය. මෙම පඬුරු බැඳීමේ චාරිත්‍රය බෞද්ධ හා හින්දු යන දෙපිරිසම සිදු කරනු ලබන වතාවතක් ලෙස සැලකිය හැකි ය. මෙම ශාන්තිකර්මයේදී නර්තනය පිණිස භාවිත කරනු ලබන කවි තුළින් බොහෝ බෞද්ධාගමික සංකල්පයන් ඉස්මතු වන බව විශේෂයෙන් අවධාරණය කළ හැකි ය. ඒ අතරින් විශේෂයෙන් පින් - පව් පිළිබඳ සංකල්පය පෙන්වා දිය හැකි ය.

සංසාර බැඳී වැඳී ආනෙම් වගෙ
කුසලානම් කර්මයේ පළ
සෙත් පුරක් පුරවා වදින්න වග
සමයෙහි නිවනට මග.

මෙවැනි බොහෝ කවි ඒ සඳහා භාවිත කිරීමෙන් පෙනී යන්නේ මෙහි අභ්‍යන්තර හරය බෞද්ධාගම මත බිහි වූවක් බව යි. මෙම පද්‍යය තුළින් ගම්‍යමාන වන්නේ නිවන, සංසාරය, කුසල් හා අකුසල් පිළිබඳ ව ද මෙම ශාන්තිකර්මයේදී අදහස් ඉදිරිපත් වූ බව යි. ඊට අමතර ව මෙම ශාන්තිකර්මයේ අවසාන දින තුළ රාත්‍රී කාලය මුළුල්ලේ මෙම නර්තනය පවත්වන අතර අවසානයේදී භික්ෂූන් වහන්සේලා විසින් පිරිත් දේශනයක් ද සිදු කරනු ලබයි. මහනුවර විෂ්ණු දේවාලය තුළ පිරිත් දේශනයක් සිදු වීම තුළින් මෙම ශාන්තිකර්මය හින්දු හා බෞද්ධ විශ්වාසයන් විද්‍යාමාන වන අතර එය සංකේතාත්මකව නිරූපණය වීමක් මෙයින් සිදු වේ. එමෙන් ම මෙම ශාන්තිකර්මය සඳහා භාවිත වන පූජා භාණ්ඩ වශයෙන් ලෙලි නොගැසූ පොල් ගෙඩි, පහන්, සහල් ආදිය භාවිත වේ. හුදෙක් මෙම පූජාද්‍රව්‍යය සශ්‍රීකත්වය බලාපොරොත්තුවෙන් පූජා කරන බව අනුමාන කළ හැකි අතර එකී විශ්වාසයන් පාරම්පරිකව මිනිසා විසින් නිර්මාණය කරගත් විශ්වාසයන් යළි ප්‍රතිනිර්මාණය කිරීමක් වශයෙන් මෙහි දී පෙන්වා දිය හැකි ය. මෙම ශාන්තිකර්මය සඳහා නිර්මාණය කරනු ලබන සොළොස්මගල වෙන කිසිදු ශාන්තිකර්මයක් උදෙසා භාවිත නොකරයි. සහල් මත නර්තනයේ යෙදීම ලාංකික ජනයා කිසිදු අවස්ථාවක නොකරන ක්‍රියාවක් ලෙස සැලකෙන අතර එයින් සහල්වලට අගෞරව වන බව සැලකීමත් මෙම අවස්ථාවේදී එය එසේ නොසැලකීම තුළින් ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම අතර මෙම ශාන්තිකර්මය අග්‍රගන්‍ය වන බව පැහැදිලිව නිගමනය කළ හැකි ය.

**නිගමනය**

වලියකුම හෙවත් වලියක් මංගල්‍යයේදී දක්නට ලැබෙන බොහොමයක් සංස්කෘතිකාංගයන් අනෙකුත් ශාන්තිකර්මයන්ට වඩා වැඩි සුවිශේෂත්වයකින් යුක්ත බව මෙම පර්යේෂණය තුළින් අවධාරිත විශේෂ කරුණකි. එහි පවතින පඬුරු ගැට ගැසීම මෙන් ම පිරිත් සජ්ඣායනය මෙහිලා සැලකිය හැකි විශේෂිතම බෞද්ධ සංස්කෘතිකාංග යන් වන අතර මේවායින් මෙම ශාන්තිකර්මයට බෞද්ධ මුහුණුවර ලැබී ඇති බවත් නිගමනය කළ හැකි ය. එමෙන් ම මෙය පවත්වනු ලබන ස්ථානය මහනුවර විෂ්ණු දේවාලය ලෙස තෝරා ගැනීමෙන් හා මෙහි එන නැටුම් සම්ප්‍රදායයේ ඇතැම් තැන් කොහොඹා කංකාරියට සමාන වීමත් ඊට අමතර ව මෙම ශාන්තිකර්මය වෙනුවෙන් එයට සහභාගි වන පුද්ගලයා පාරිශුද්ධත්වයට පත්වීම අතිශය වැදගත් ලෙස සැලකීම බෞද්ධ ආගමික සභ්‍යත්වය ඉක්මවා හින්දු විශ්වාසයන් පිළිබිඹු කරන්නක් බව පෙනේ. මෙම සංස්කෘතිකාංගය විෂයෙහි නිපුණත්වය ලබා සිටින විද්වත් පිරිස හා පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවන්හිදී මේ පිළිබඳ ව ගොඩනැගුණු තර්කය වන්නේ දළදා පෙරහැර යනු සතර දේවාල ප්‍රධාන කොට ගනිමින් පවත්වනු ලබන බෞද්ධ සංස්කෘතික අංගයක් වන බව යි. එබැවින් මෙම ශාන්තිකර්මය හින්දු හා බෞද්ධ මිශ්‍ර මුහුණුවරක් ගෙන තිබෙන බව ඔවුන් අවධාරණය කරනු ලබති. එබැවින් මෙයින් නිගමනය වන්නේ දේශයේ සුබ සිද්ධිය තකා සිදු කරනු ලබන මෙම පෙරහැර මංගල්‍යය අවසානයේදී ඊට දායක වූ සියලු ආගමික විශ්වාසයන්ට ගරු බුහුමන් පිදීම සඳහා හින්දු හා බෞද්ධ විශ්වාසයන් මූලික කර ගනිමින් ජන විශ්වාසයන් සංයෝග කොට ගෙන පවත්වනු ලබන විශේෂ ශාන්තිකර්මයක් වන බව යි. එසේ ම හින්දු හා බෞද්ධ ආගම මිශ්‍රිත විශේෂ සංස්කෘතිකාංගයන් වලියකුම ශාන්තිකර්මයෙහි නිර්මාණය වී ඇති බව හා එමඟින් ආගමික සංහිඳියාව නිරූපණය වන බව අවසාන වශයෙන් නිගමනය කළ හැකි ය.

**මුඛ්‍ය පදඃ** බෞද්ධ, මංගල්‍යය, වලියකුම, වලියක් ශාන්තිකර්මය, හින්දු

## ආශ්‍රිත ග්‍රන්ථ

බණ්ඩාර ප්‍රසන්න එච්. එස්. එම්. (2005). *වලියක් මංගල්‍යය සහ බෞද්ධ පාරම්පරික උත්සව*. සරසවි ප්‍රකාශයෝ.

සේනාරත්න, රත්නසිරි (2010). *සෞභාග්‍ය මංගල්‍යය- පෞරාණික ශ්‍රී ලංකාවේ ආචාර*, අතුල ප්‍රකාශයෝ.

හැගොඩ, විල්සන් (1998). *ශ්‍රී ලංකාවේ ජනකතා සහ පුරාණ මංගල්‍යය*. මුතුමණි ප්‍රකාශකයෝ.